ප්‍රායෝගික කෘෂිකර්ම

# ඔබේ ගෙවත්තෙත් බොම්බයි ළූනු වවන්න

බොම්බයිළූනු එයට දුන් නාමය ලෙසින්ම අපේ රටට පිට රටින් ගෙන්වීම කාලයක් තිස්සේ සිදු කෙරිණ. එහෙත් එම ළූනු අපේ රටේ බොහෝ ප්‍රදේශවල වැවිය හැකි බව ඔබ දන්නවාද? ඔබේ ප්‍රදේශයේත් ළූනු වැවිය හැකිදැයි මේ ලිපිය කියවා බලන්න.

ශ්‍රී ලංකාවට අවශ්‍ය බොම්බයි ළූණු මෑතක් වන තුරු ප්‍රධාන වශයෙන් පිටරටින් ගෙන්වනු ලැබීය. නමුත් පසුගිය වසර කීපයේ වියලි කලාපයේ සමහර ප්‍රදේශවල ගොවීන් සාර්ථකව බොම්බයි ළූණු වගා කර ඇත. වියලි කලාපයේ, අන්තර මැදි කලාපයේ හා තෙත් කලාපයේ සමහර ප්‍රදේශවල සාර්ථකව බොම්බයි ළූණු වගා කල හැකි බව නිරීක්ෂණය කර ඇත. මේ අනුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සුදුසු ප්‍රදේශවල බොම්බයි ළූණු වගාව ව්‍යාප්ත කිරීමට කටයුතු කරගෙන යයි.

බොම්බයි ළූණු ගොවීන්ට හෙක්ටයාර් එකකින් වැඩි ශුද්ධ ආදායමක් ලබාගත හැකි බෝග කීපයෙන් එකකි. වියලි කලාපයේ සමහර ප්‍රදේශවල ජල සම්පාදනය සහිත හෙක්ටයාර් එකක් බොම්බයි ළූණු වගා කිරීමට රුපියල් විසිපන්දහසේ සිට තිස් දහසක් පමණ වැය වෙන බව වාර්තා වේ. අස්වනු නෙලා ගන්නා බොම්බයි ළූණු කිලෝ එකක් රුපියල් 6.00 බැගින් විකිණීමට හැකි නම් සාර්ථක වගාවකින් හෙක්ටයාර් එකකින් ලබන ශුද්ධ ආදායම රුපියල් තිස්පන්දහස ඉක්මවයි. මෙයට වඩා අධික ආදායම් ගොවීන් විසින් ලබා ගෙන ඇති බවද වාර්තාවේ.

**වගා කරණ කාලය:-**

වියලි කලාපයේ යල් කන්නයේ මෙම බෝගය සාර්ථකව වගා කල හැක. වියලි කලාපයේ යල් කන්නයේදී තද වර්ෂාවන් ගෙන් පසුව මෙම බෝගය ක්ෂේත්‍රයේ පිහිටුවීම වඩා සුදුසුවේ. කෙසේ වෙතත් අන්තර් කලාපයේ තද වර්ෂාවෙන් රහිත වියලි මාස හතරක් ඇති ප්‍රදේශවල පමනක් ජල සම්පාදනය යටතේ බොම්බයි ළූණු වගා කල හැක. අස්වනු නෙලන කාලයේ වියලි කාල ගුණයක් පැවතීම ඉතා වැදගත්වේ. මේ නිසා බොම්බයි ළූණු වගාවට සුදුසු ප්‍රදේශ හඳුනා ගැනීමේදී ඉහත කරුණු කීපය ගැන සැලකිලිමත් විය යුතුවේ.

කෘෂිකර්ම නිලධාරී
— කිත්සිරි පෙරේරා විසිනි —

**නිර්දේශිත ප්‍රභේදය:-**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පූනා රෙඩ් ප්‍රභේදය නිර්දේශ කර ඇත. බල්බය රතු පැහැති වීම, සැර බව අධිකවීම හා හොඳ අස්වනු ලබා දීම ආදිය මෙම ප්‍රභේදයේ ලක්ෂණයි.

**බීජ අවශ්‍යතාවය:-**

හෙක්ටයාර් එකක වගාව පිහිටුවීම සඳහා බොම්බයි ළූණු කිලෝ ග්‍රෑම් 8 - 9 පමණ අවශ්‍ය වේ. බීජ වල ප්‍රරෝහණය වීමේ හැකියාව ඉතා උසස් මට්ටමක තිබේ නම් හෙක්ටයාර් එකකට බීජ කිලෝ ග්‍රෑම් 8 ක් ප්‍රමාණවත්වේ.

## අවශ්‍ය තවාන් පාත්ති ප්‍රමාණය:-

තවාන් සඳහා පළමුව සුදුසු ස්ථානයක් තෝරා ගතයුතුවේ. මෙහිදී හොඳින් හිරු රැස් ලැබීම, ගැඹුරු හා හොඳින් ජලවහනය වන පසක් සහිත වීම හා පිරිසිදු ජලය ලබා ගත හැකි වීම ආදී කරුණු සලකා තවාන සඳහා ස්ථානයක් තෝරා ගත යුතුවේ. බොම්බයි ළූණු තවාන් පාත්ති වලට ජල සම්පාදනය කරන ක්‍රමය අනුව ප්‍රමාණයන් දෙකක තවාන් පාත්ති ගොවීන් විසින් සාද ගනු ලැබේ. මල් බාල්දි වලින් ජලය සැපයීම කරන ගොවීන් සෙ. මී. 90 පළල හා මීටර් 3 ක් දිග ඇති උස් තවාන් පාත්ති සාදගනී. මෙවැනි තවාන් පාත්ති 135 හෙක්ටයාර් එකක වගාවකට පැල ලබා ගැනීමට අවශ්‍යවේ. මල් බාල්දි වලින් ජල සම්පාදනය කරන විට අහිත කර හා අවාසිදයක තත්වයන් කීපයක් ඇතිවේ. ඒවා නම් මල් බාල්දි වලින් ජලය දමන විට තවාන් මතු පිට පස තද වීම නිසා ජලය උරා ගැනීමට බාධාවීම, තවාන් පාත්ති මට්ටම් වීම ඒකාකාර නොවුනු විට ජලය පහත් ස්ථානවල එකතුවීම නිසා මෙවැනි ස්ථාන වල වර්ධනය දුර්වල වීම, ජල සම්පාදනයට අධික ශ්‍රමයක් හා කාලයක් වැය වීමවේ. දෙවෙනි තවාන් වර්ගය සෙ. මී 75 පළල හා මීටර 3 ක් දිග උස් පාත්ති වේ. මෙම තවාන් පාත්ති වලට ජල සම්පාදනය කිරීමේදි පාත්ති අතර වූ කාණු ජලයෙන් පුරවා පාත්ති වලට ජලය උරා ගැනීමට සලස්වනු ලැබේ. මෙවැනි පාත්ති 160 කින් හෙක්ටයාර් එකක වගාවක් සඳහා අවශ්‍ය බොම්බයි ළූනු පැල ලබා ගත හැක. සමහර ප්‍රදේශවල ජල පිරිමසා ගැනීම සඳහා ගිල්වූ තවාන් පාත්තිද බොම්බයි ළූණු තවාන් සඳහා භාවිතා කරයි.

## තවාන් පාත්ති සැකසීම:-

පළමුව තවාන් බිම වල් පැල ආදියෙන් තොර කර ගත යුතුවේ. මේ සඳහා වල් ශාක හා වෙනත් ශාක සුන්බුන් පසට යට නොකර තවාන් බිමෙන් ඉවත් කර ගත යුතුවේ. ඉන්පසු තවාන් බිම සෙ. මී. 15 ගැඹුරකට බිම පෙරලීම සිදු කරනු ලැබේ. කැට පොඩි කර සියුම් ලෙස පස සකස් කරගත යුතුවේ. හොඳින් ජලය බැස යන පරිදි තවාන් බිම වටා කාණු සකස් කර ගැනීම ඵලදායි කල යුතුවේ. ඉහත කාර්යයන් නිම කිරීමෙන් පසු තවාන් පාත්ති යැකසීම කරනු ලැබේ. ඉන් පසු තෝරා ගත් පළලට උස් තවාන් පාත්ති මීටර 3 ක් දිගට සකස් කරගනු ලැබේ. සෑම උස් තවාන් පාත්ති මීටර 3 ක් දිගට සකස් කරගනු ලැබේ.



මෙබඳු ගොවි තරුණයන්ට බොම්බයි ළූනු වගාවෙන් ආදයමක් ලැබිය හැකිය.

සෑම උස් තවාන් පාත්ති දෙකක් අතරම සෙ. මී 30 පමණ පළල ඇති කාණුවක් තිබිය යුතුවේ.

බොම්බයි ළූණු තවාන් පාත්ති වලට හොඳින් දිරා ගිය කාබනික පොහොර යෙදීම වැදගත්වේ. මේ සඳහා හොඳින් දිරා ගිය කොම්පෝස්ට් හෝ හොඳින් දිරා ගිය ගොම පොහොර වැනි කාබනික පොහොරක් භාවිතා කල හැකිවේ. ඉහත සඳහන් කාබනික පොහොර වර්ගයකින් කූඩ දෙකක් පමණ තවාන් පාත්තියකට යෙදීම සුදුසුවේ. ඉන්පසු එම කාබනික පොහොර පාත්තියේ මතුපිට ඇති පස් සමහ අඟල් 3-4 ගැඹුරට මිශ්‍ර කරනු ලැබේ.

## තවාන් පාත්ති ජීවානුහරණය කිරීම:-

තවාන් පාත්ති ජීවානුහරණය කිරීමෙන් බලාපොරොත්තුවන්නේ රෝග කාරක දිලීර වැනි ක්ෂුද්‍ර ජීවින් හා හානි දයක කෘමීන් පසේ ජීවත් වන්නේ නම් ඔවුන් හැකි තරම් දුරට විනාශ කිරීමයි. විශේෂයෙන් තවාන් පාත්ති වල තවාන් පැලවලට සෑහෙන දියමලන් කෑමේ රෝගය තවාන් පාත්ති ජීවානුහරණය කිරීමෙන් මහ හරවා ගත හැක.

බොම්බයි ළූණු තවාන් පාත්ති ජීවානුහරණය කිරීමට ප්‍රධාන වශයෙන් ක්‍රම දෙකක් භාවිතා කල හැක. ඒවා නම් ගිණි තැබීම මගින් ජීවානුහරණය කිරීමයි. තවාන් පාත්ති ගිණි තැබීම මගින් ජීවානුහරණය කිරීමේදී පළමුව තවාන් පාත්ති වල පස අඟල් 3 ක් ගැඹුරට තෙමෙන පරිදි තෙත් කල යුතුවේ. ඉන්පසු පිදුරු හා දහයියා මාරුවෙන් මාරුවට අඟල් 10 ක් උසට ඇතිරිය යුතුවේ. පිදුරු තට්ටු අඟල් 2 ක් පමණද දහයියා තට්ටු අඟල් 1 ක් පමණද ඝන කමට මාරුවෙන් මාරුවට අඟල් 10 උසට ඇතිරීම කල යුතුවේ. ඉන්පසු තද සුළං නැති අවස්ථාවකදී සුළං අතට විරුද්ධ දිශාවෙන් තවානට ගිණි තැබීම කල යුතුවේ. සෙමින් සෙමින් වැඩි වෙලාවක් දහයියා හා පිදුරු ගිණි තැබීම සිදුවූවිට රත් වූ ජල වාෂ්ප මගින් හොඳින් තවාන් පාත්ති ජීවානුහරණයවේ. මෙසේ දෙතාවක් පමණ ගිණි තැබීමෙන් බොහෝ දුරට ජීවාහරණය කර ගැනීමට පුළුවන.

රසායනික ද්‍රව්‍ය යොදා ගෙනද තවාන් ජීවානුහරණය කිරීමට පුළුවන. බීජ සිටුවීමට පෙර පහත සඳහන් දිලීර නාශක යොදා ගෙන තවාන් පාත්ති ජීවානුහරණය කල හැක. වෙළඳ පලේ ඇති බ්‍රැසිකෝල් නම් දිලීර නාශකයෙන් (පී සී එන් බී. නම් රසායනික ද්‍රව්‍ය අඩංගු දිලීර නාශකයන්) ග්‍රෑම් 05 ක් ජලය ලීටර් 10 දියකර වර්ග මීටර් එකක තවාන් පාත්ති කොටසකට යෙදිය යුතුවේ. තවානේ බීජ සිටුවීමට දිනකට පෙර මෙය කල යුතුවේ. එසේ නැත්නම් වෙළඳ පලේ ඇති කැප්ටාන් නම් දිලීර නාශකයෙන් අවුන්ස එකක් ජලය ගැලුම් 1 1/2 දියකර වර්ග අඩි 100 යෙදිය යුතුවේ. මෙම දිලීර නාශකයද බීජ සිටුවීමට දිනකට පෙර තවානට යෙදිය යුතුවේ. පසේ පාංශු දිලීරය අධික ප්‍රදේශවල තවාන් පාත්ති දමන්නේ නම් ගිණි තැබීම හා රසායනික ද්‍රව්‍ය තවාන් පාත්ති මතට යෙදීම මගින් ජීවානුහරණය කිරීම වඩා සුදුසුවේ.

## තවානෙ බීජ සිටුවීම:—

තවාන් පාත්ති ජීවානුහරණය කරගත් පසු පහත සඳහන් පොහොර ප්‍රමාණයන් යොදා පස සමඟ හොඳින් මිශ්‍රකර ගත යුතුවේ. යූරියා කිලෝ ග්‍රෑම් 2.3 කද. සාන්ද්‍ර සුපර් පොස්පේට් කිලෝ ග්‍රෑම් 2.3 කද හා මියුරියේට් ඔෆ් පොටෑෂ් කිලෝ ග්‍රෑම් 2.3 කද ගෙන හොඳින් මිශ්‍ර කර එම මිශ්‍රණය හෙක්ටයාර් එකක වගාවක් සඳහා පිළියෙල කර ඇති තවාන් පාත්ති වලට යෙදීම කල යුතුවේ. එසේ නැතහොත් ළූණු පොහොර මිශ්‍රණයෙන් හෙක්ටයාර් එකක තවාන් ප්‍රමාණයට කිලෝ ග්‍රෑම් 09 ක් යෙදීම කල යුතුවේ. ඉන්පසු තවාන් පාත්ති හොඳින් මට්ටම් කර සියුම්ව සකසා ගත යුතුවේ. තවාන් පාත්තිවල හරස් අතට සෙ. මී. 10-12.5 පරතරය තිබෙනසේ සෙ. මී. 1 ගැඹුරට පේළි සලකුණු කරගත යුතුවේ. මෙම පේළි වල බීජ සිටුවීම කල යුතුවේ. සෙ. මී. 1 කට වඩා ගැඹුරින් බීජ සිටුවීම වලකාගත යුතුවේ. බීජ සියුම් පස් තට්ටුවකින් වැසිය යුතුවේ තවානේ පිළිස්සූ පස්ම භාවිතා කරන්නේ නම් වඩා සුදුසුවේ. තවානේ පාත්ති වල බීජ සිටවූ පසු මෙතමිඩපොස් (වෙළඳ නම් මෙතමිඩපොස් හෝ ටැමරෝන්) හෝ මොනක්‍රොටොපස් (වෙළඳ නම් අසෝඩ්‍රින්, නුවක්‍රෝන්, හා මොනොක්‍රොටොපස්) යන රසායනික ද්‍රව්‍ය අඩංගු කෘමි නාශකයක් තවාන් මතට යෙදිය යුතුවේ පසුව තවාන් පාත්ති වලට මල් බාල්දියකින් හොඳින් ජලය සැපයීම කල යුතුවේ. තවාන් පාත්ති වලට බීජ ප්‍රරෝහනය වන තුරු දිනපතා ජල සම්පාදනය කිරීම වැදගත්වේ. දින 6-8 ගතවූ පසු බීජ ප්‍රරෝහනය වී පැලෙන් මතුවේ. මෙ අවස්ථාවේදී තවාන් මත අතුරා ඇති පිදුරු ආවරනය ඉවත් කිරීම වැදගත්වේ. දිලීර රෝග වලකා ගැනීමට පැලවී ගෙන එන බොම්බයි ළූණු තවානකට කාප්ටාන්, ඩැකොනිල්. ඩෙල්සින් එක්ස් වැනි දිලීර යෙදීම කල යුතුවේ.

## තවාන් ආවරණය කිරීම :

අධික වර්ෂාවෙන් හා රාත්‍රී කාලයේ පින්න වැටීමෙන් බොම්බයි ළූණු තවාන් ආරක්ෂා කර ගැනීම සඳහා තවාන් ආවරණය වැදගත්වේ. අධික වර්ෂාව පවතින කාලසේදී තවාන් වර්ෂාව ඇති විටක පමණක් ආවරණය කිරීම වැදගත්වේ. තවද රාත්‍රී කාලයේ පින්න අධික නම් රාත්‍රී කාලසේදී තවාන් ආවරණය කිරීම වැදගත් වේ. තවාන් ආවරණය කිරීමට පොලිතින් පොල් අතු යොදා ගත හැක. තවානට සෙ. මී. 60 පමණ ඉහලින් සිටින සේ හා සුළඟට ඔරොත්තුදෙන සේ ආවරණ සාදා ගැනීම කල යුතුවේ.

## තවානට ජලසම්පාදනය කිරීම :

තවාන් වලට ජලසම්පාදනය කිරීම සඳහා පිරිසිදු ජලය භාවිතා කිරීම වැදගත්වේ, එක තැන රැඳී පල් වූ ජලය තවාන් වල ජල සම්පාදනය සඳහා භාවිතා කිරීමෙන් තවානේ රෝග වැඩි වීමට ඉඩ ඇත. තවාන් පාත්ති අතර කාණු ජලයෙන් පුරවා තවාන් පාත්ති වලට ජලය උරා ගැනීමට ඉඩ දීය යුතුවේ. පාත්ති සම්පූර්ණයෙන් ජලයේ ගිල්වීම සුදුසු නොවේ. තවානේ පසේ තෙතමනය ඒකාකාරව පවත්වා ගැනීම වැදගත්වේ. තවාන් පසේ ජලය අඩු වූ විට තවාන් පැලවල වර්ධනය බාලවේ. අධික ලෙස තවාන් පස තෙත් ගතියෙන් යුක්ත වූ විට තවානේ පැලවලට විවිධ දිලීර රෝග වැලඳීමට ඉඩ ඇත.

## තවානේ රෝග මර්ධනය :

### 1. දියමලන් කැමේ රෝගය

තවාන් පැල වලට පාංශු දිලීර රෝගකාරකයින් නිසා දියමලන් කැමේ රෝගය ඇතිවේ. තවාන් පසේ අධික තෙතමනය මෙම රෝගය වැළදීමට හිතකර තත්වයක් ඇති කරයි. මෙම රෝගය නිසා තවාන් පාමුලෙන් වැටීම සිදුවේ. රෝග මර්ධනය සඳහා රෝගී පැල ගලවා ඉවත් කර ඉතිරි නිරෝගී පැලවල පාමුලට වදින සේ කැප්ටාන් වැනි දිලීර නාශකයක් යෙදීම කල යුතුවේ. මෙම රෝගය තවානේ වලකා ගැනීම සඳහා තවාන් පාත්ති හොඳින් ජීවානුහරණය කිරීම, තවානේ තෙතමනය පාලනය කිරීම හා තවාන් පැල පේළි අතරමකර කරන ලද දහයියා දැමීම කල හැක.

### 2. දම් පැහැති පුල්ලි රෝගය:

රෝග ලක්ෂණ වන්නේ පත්‍ර මතුපිට තෙත්වූ පැල්ලම් ඇති වීමයි. රෝග මර්ධනයට ඩැකොනිල් හා ඩයිතේන් එම් වැනි දිලීර නාශකයක් දින හතරකට වරක් යෙදීම කල යුතුවේ. තරමක් වැඩුණු තවාන් පැලවලට මෙම රෝගය වර්ෂාව අධික විට ඇති විය හැක.

### 3. තවානේ වට පනු හානිය මර්ධනය :

සමහර ප්‍රදේශවල දී බොම්බයි ළූනු තවාන් වලට පසේ ජීවත් වන ඉතා කුඩා ජීවීන් කොටසක් වන වටපනු විශේෂයක් හානි කරයි. එවැනි ප්‍රදේශවල තවානේ වටපනු හානිය ඇතිවීමට පෙර වලකා ගැනීම සඳහා පියවර ගත යුතුවේ. බීජ පැල තවානෙන් මතු වී දින 14 කට පසු සෙ. මී. 90X මීටර 3 තවානකට කාබොෆියුරාන් 3% කට (වෙළඳ නම කාබොෆියුරාන්, කුරේටර්, හා ෆියුරඩාන්) යන නමින් හඳුන්වන වටපනු නාශකයක් ලෙස ක්‍රියා කරන රසායනික ද්‍රව්‍යයෙන් අවුන්සයක් පමණ යොදා තවාන් තෙත් කල යුතුවේ. මෙසේ කිරීමෙන් තවානේ වටපනු හානිය ඇති වීම වලකා ගත හැක.

## තවානේ කෘමි හානිය මර්ධනය:

තවානේ දී පැල මැක්කන්ගේ හා ළූනු දළඹුවාගේ හානිය ඇතිවිය හැක. මෙම හානිය හඳුනාගත් විගස මෙම ලිපියේ පසු තැනක විස්තර වන මර්ධන ක්‍රම අනුගමනය කල යුතුවේ.

## තවාන් පැලවල වර්ධන :

ප්‍රරෝහණය වී පසෙන් මතුවන බොම්බයි ළූනු පැල සුදු පාට වන අතර පැල දින 2-3 කදී දිග හැරී කොළපාට වේ. සති 6 කදී පත්‍ර විශාලව වැඩී ඇති අතර පැලවල සාමාන්‍යයෙන් උස අඟල් 6-8 පමණ වේ, තවාන් පැලවල වර්ධනය දුර්වල නම් සති 4 කදී පමණ යූරියා ස්වල්පයක් තවානට යෙදීම සුදුසුවේ. මේ සඳහා තවාන් පේළි අතර යූරියා ස්වල්ප වශයෙන් දමා එය පස සමඟ හොඳින් මිශ්‍ර කල යුතුවේ.

## තවානේ පැල තේරීම:

දින 38 සිට දින 45 අතර කාලයේදී තවානේ පැල ගැලවීමට සුදුසු ප්‍රමාණයට වර්ධනයවේ. ගලවා සිටුවීමට සුදුසු තවාන් පැලවල උස සෙ.මී. 20 පමණ විය යුතු අතර එහි පාදය තරමක් මහත්වූ (මුල් ඇටයකට වඩා විශාලව) හා පත්‍ර හතරක් සහිත විය යුතුවේ. බල්බ සැදීම ආරම්භ නොවූ හෝ පත්‍ර දෙකක් හෝ ඊට අඩු පත්‍ර ඇති ලිස්සු පැල වැනි පල ක්ෂේත්‍රයේ සිටුවීම සඳහා තෝරා නොගත යුතුවේ. මෙවැනි පැල වලින් හොඳ අස්වනු නොලැබේ.

## බොම්බයි ළූනු වගාවකට සුදුසු ඉඩමක ලක්ෂණ :

හොඳින් ජලවහනය වන හා ජල සම්පාදන පහසුකම් ඇති ඉඩම් බොම්බයි ළූනු වගාවට

යුතුවේ. මුහුදු මට්ටමේ සිට අඩි 6000 ක් දක්වා උස ප්‍රදේශවල ළූනු වැවිය හැකි වුවද අධික වර්ෂාව සහිත ප්‍රදේශයක් බොම්බයි ළූනු වගාවකට සුදුසු නොවේ. තවද බෝගය මෝරන කාලයේදී වියලි කාලගුණයක් පැවතීම ඉතා වැදගත්වේ.

## ක්ෂේත්‍රය සකස් කිරීම:

ක්ෂේත්‍රය මනාව සී සා සකස් කරගත යුතුවේ. බෑවුම් සහිත ඉඩම් වල පාංශු සංරක්ෂණ කළ යුතු ගැන අවධානය යොමුකළ යුතුවේ. තැනිතලා පාත්තිවල දිග මීටර් 60 කට වඩා අඩු විය යුතුවේ. මීට වඩා දීර්ග වූ විට ජල සම්පාදනය අපහසුවේ. පාත්ති අතර වූ කාණු වලට ජලය පුරවා ජල සම්පාදනය කිරීමේදී දෙවන රූප සටහනේ පෙන්වන පරිදි මීටර් 60 පරතරවලින් සෙ. මී. 20 පමණ ගැඹුරු කාණු සකස් කර ගත යුතුවේ. මෙම ක්‍රමයට ජල සම්පාදනය කරගත හැක්කේ බෑවුම ඉතා අඩු ඉඩම් වල පමණි. ජල සම්පාදනය කිරීමේදී පාත්ති එකිනෙකින් වෙන් කරන සෙ. මී. 10




රූප සටහන 01 - තවාන් පාත්තියක හරස් කඩක්.

අඩිමීල කාණු වලට ජලය පුරවා ජල සම්පාදනය කිරීමට බලාපොරොත්තු වන විට පහත සඳහන් අන්දමට ක්ෂේත්‍රය සකසා ගතයුතුවේ. උස් පාත්ති සෙ. මී. 60 පළලට සකසා ගත යුතු අතර සෙ. මී 25 පළල කාණු සකසා ගත යුතුවේ. පාත්ති වල උස සෙ. මී. 10 පමණ විය යුතුවේ. ගැඹුරු කාණු ජලයෙන් පුරවා පාත්ති වලට ජලය උරා ගැනීමට සලස්වයි. සෙ මී. 20 ගැඹුරු කාණු වර්ෂා පතිත කාලයේදී ජලවාහනය සඳහා උපයෝගි කර ගනු ලැබේ.




රූපය 02 පාත්ති අතර කාණුවල ජලය පුරවා ජල සම්පාදනය කරන ක්‍රමයක පාත්ති සහ කාණු දිග්විය යුතු ආකාරය